# ඒ මහා වතුර.

ලංකා ඉතිහාසයෙහි කොතැනක වත් දක්නට නො ලැබෙන තරම් මහත් හානියක් ඇති කරමින් පසු ගිය අගෝස්තුවෙහි පැමිණි මහා ගං වතුර සිහි කිරීමට පවා බිය එළවන සුලු ය. ජලය, ගින්න සහ වායුවත් ස්වාභාවික ලෞකික ලක්ෂණ බව සැබෑවි. පොළොවෙහි ම වැඩී, පොළොවට ම බත් විය යුතු සත්ත්ව ගණයටත්, වෘක්ෂ ලතාදියටත් අන්‍යෝන්‍යෝපකාරී ව පවත්නේත් ඒ ලක්ෂණ ම බව ද එ සේ ම සැබෑවි. එහෙත්, ස්වභාව ගුණ ඉක්මවා චණ්ඩ වුණු තන්හි මේ ඉතා හිතවත් 'ගුණයන්ගෙන්' විය හැකි හානිය ප්‍රත්‍යක්ෂ කරන්නට ලැබෙන්නේ කලාතුරකිනි.

ජලයේ බලයෙන් කළ හැකි මහත් විනාශය පළ කරමින් ගිය අගෝස්තුවෙහි ඇති වුණු ඒ මහා ගං වතුරෙන් සිදු වුණු තරම් හානියක් මේ රටට නම් ද්විතීය ලෝක මහා සංග්‍රාමයෙන් වත් නො වී ය යි කීම අධිකෝක්තියක් නොවේ. දහස් ගණන් ජන කායයකට උන් හිටි තැන් නැති කොට ගෙන; උන්ගේ හරකා-බාන, ගේ-දොර, යට කොට ගෙන; ගහ-කොළ දිය බත් කොට ගෙන;

වළ තැන් ගොඩ කරමින්, ගොඩ තැන් වළ කරමින් ගැලූ ඒ මහා වතුර සිහි කිරීමට පවා බියකරු ය. ඒ වතුරෙහි ලා අති භයංකර මාරක වේශය ගත්තේ මහවැලි ගඟ සහ කැලණි ගඟ ද වැනි ගංගා බව සැබෑ වුවත්, එහි බලයට යට නොවන තැන් ද නොබේරුණේය. එබඳු තැන ඇළ දොළ වැවු පොකුණු ආදිය ද බිහිසුණු වී ය; එ ද නොලැබුණු තැන, ගස් ගල් පවා භීෂණ වේශයෙන් නැගී ආයේ ය.

මේ මහා විපතින් අප රටට වුණු හානිය පිරිමසන්නට තව කො තරම් කාලයකින් පිළිවන් වේ දැ යි නොකිව හැකි ය. වුණු හානිය එ තරම් ම බලවත් හෙයිනි. සෞභාග්‍ය සම්පන්න ලංකාවක් බිහි කිරීම පරමාර්ථය කොටගෙන ක්‍රියා කරන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ද මේ මහා විපත්තියෙන් නො මිදුනේය. සාමාන්‍යයෙන් කෘෂිකාර්මික ජනතාවට වන හානිය මේ දෙපාර්තමේන්තුවට වන හානියක් ලෙස සැලැකිය යුතු වේ. මේ විපතින් වැඩි හානිය වූයේ එබන්දනට ය යි කීම නිවැරැදි ය. එ හෙයින්, එය අපගේ මහත් ශෝකය පිණිස පවතී.

එය මදකට තිබියේ වා! කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් පේරාදෙණි උද්භිදෝද්‍යානයෙන් වැඩි කොටසක් ද මේ වර මහ වතුරට යට වූයේ ය. එයින් එහි පිහිටි වටිනා ගොඩනැගිලි ගණනක් ද බලවත් හානියකට පත් වී ය. එහි ප්‍රතිඵල වශයෙන් කෘෂිකර්ම ප්‍රචාරකාංශයට අයත් ලියකියවිලි, පොත් පත් සහ බඩු බාහිරාදිය රාශියක් ද නාසති වූයේ ය. එ ද සමස්ත ලංකා කෘෂිකාර්මික ජනතාවට සිදු වුනු පාඩුවකැ යි ගැණීම යුක්ති යුක්තය.

කෘෂිකර්ම ප්‍රචාරකාංශය මගින් ප්‍රසිද්ධ කරනු ලබන ගොවිකම් සඟරාවට ද මේ අපලයෙන් අපල වී ය. මේ අවුරුද්දේ තුන් වැනි කලාපය කලට නිකුත් කරගත නුහුනුයේ එ හෙයිනි. කරුණු මෙසේ වූයෙන් ඒ අඩු පාඩුවත් පිළිවන් පමණින් පිරිමසන අතර ම, පාඨකයාට ද පිළිවන් තරම් යහපතක් කරනු සඳහා තුන් වැනි සහ සිවු වැනි කාණ්ඩ දෙක එක් කොට විශාල කරන ලද කලාපයක් නිකුත් කරන්නට අපි අදහස් කළම්හ. පිටු ගණනින් වැඩි වූ ලිපි-ලේඛනයෙන් හර බර වූ, මේ කලාපය පාඨකයන් ගේ සිත් ගනිතී යි යනු අපගේ අපේක්ෂාව වෙයි.

මහ වතුරෙන් විනාශයට පත් ගහකොළ නිසා වුනු පාඩුව හැකි තරම් දුර පිරිමැසීම පිණිස, ඇවැසි ගහකොළ බෝ කිරීම ත්, ආහාර ද්‍රව්‍ය සුලභ කිරීම ත් සඳහා සියලු ලංකා පුත්‍රයෝ උත්සාහ ගනිත් වා යි ද ඉල්ලා-සිටුම්හ.